**කලා ලොව දිග්විජය කළ නිශ්ශංක දිද්දෙණිය සිය අතීත මතක ආවර්ජනයට මෙසේ අප හා එක්විය.**



# වේදිකාව දිග්විජය කළ දිගා

**? අද නිශ්ශංක දිද්දෙණිය වුණාට මුලින් ඔබේ නම වෙන එකක්. මොකද්ද මේ නම් මාරුව. එතනින්ම අපේ කතාබහ පටන්ගමු....**

මුලින් මගේ නම තිබුණෙ හෙන්දිරික් සිංඤෝ කියල. ඒ කාලෙ නම ගැන මට පොඩි හීනමානයක් තිබුණ මට ලස්සන නමක් නෑ කියල. විලියම් තඹවිට කියන ගුරුවරයා තමයි මට කිව්වෙ, ඔයා කලාවට එහෙම ටිකක් බර එක්කෙනෙක් නිසා විශ්වවිද්‍යාලෙට එහෙම ගියාම ප්‍රශ්නයක් වෙන්න පුළුවන්. ඒක නිසා ටිකක් කලාත්මක නමක් දාගන්න කියල. තාත්ත තමයි ඒ නම දැම්මෙ. ඒ කාලෙ දන නම් ඔය වගේ තමයි ඉතිං. තාත්තට කිව්වෙ පීරිස් සිංඤෝ කියල. ලොකු බාප්ප දවිත් සිංඤෝ. පොඩි බාප්ප කරෝලිස්. තව බාප්ප කෙනෙක් හිටිය එයා ජේම්ස්. අපේ ලොකු අයිය සිමියොන්. පුංචි අයිය සයිමන්. පොඩි අයිය පියදාස. ලොකු අක්ක සොයිදා. පුංචි අක්ක රොසලින් නෝනා. පොඩි අක්ක මැගී නෝනා. නංගිගෙ නම බන්දුවතී. ඔහොම තමයි වැටිච්ච නම්. ඉස්කෝලෙදි කොල්ලො මට කොලොප්පං කරනව "හෙන්දිරිකා මන්දිරිකා වල්ග දෙකේ මීහරකා" කියල. මම ඉතිං එහෙම කිව්වම උන්ගෙ පස්සෙ පන්නනව උන්ට ගහන්න. ඉස්කෝලේ හැම කොල්ලටම වගේ ඔහොම කොලොප්පමට දාපු නමක් තිබුණ.

මට ඔය නම දාන්න තාත්තට බලපාන්න ඇත්තෙ අපේ පවුලෙ නෑයෙක් වෙච්ච, රබන් ගහන්න එහෙම ඉතා දක්ෂ වැඩිහිටියෙක් වුණු හෙන්දිරික් සිංඤෝ නිසා වෙන්න ඇති. ඒ නමම මටත් දාල. එයා අපේ ගෙදර නිතර යනව එනව. සමහර දවසට මිදුලෙ මහ රබාන තියල රත් කරල එහෙම රෑ වෙනකම් රබන් ගහනව. ඒව හරි සුන්දර දේවල්. තාත්තට හිතෙන්න ඇති ඒ නම මටත් දාන්න.

**? කොහොමද ගම ගැන මතකය. සුන්දර ළමා කාලයක් එහෙම තියෙන්න ඇති....**

අපි රත්නපුර පනාවැන්න ගමේ. ඒක පැල්මඩුල්ලයි කහවත්තයි අතර තියෙන පිටිසර සුන්දර ගමක්. ගමේ පරිසරය කලාවට වුණත් හිත ඇදිල යන්න ආකස්මික බලපෑමක් වුණා කියල මට හිතෙනව. අපේ ගෙදරම ගොවි පවුලක්. තාත්ත කුඹුරු තුනක් වැඩ කෙරුව. අඳේටත් කුඹුරු කෙරුව. අම්ම ගෙවිලියක්. අම්ම ඉස්කෝලේ ගිහින් නෑ. අම්මගෙ ගම කහවත්තට එහා බුංගිරිය කියන ගම. සාගර පලන්සූරිය මහත්තයගෙ ගම. අම්මලගෙ ගෙදරට උඩින් ගල් පර්වතයක් උඩ සාගර පලන්සූරියගෙ සොහොන හදල තියෙන්නෙ. අපේ ගෙදර උඩහට ගොඩවුණාම කෙළින්ම පේන්නෙ සිරීපාදේ. කළු ගං නිම්නය ඒක.

මම අකුරු කියෙව්වෙ පනාවැන්න ධර්මාරාම විද්‍යාලයෙන්. ඒ ඉස්කෝලේ පටන්අරන් තියෙන්නෙ බලංගොඩ ආනන්ද මෛත්‍රෙය හාමුදුරුවො. අපේ ගමේ පංසල තමයි අපට බලපාපු අනිත් තැන. අපේ ගමේ පංසල පරණ වලව්වක්. මැද මිදුලක් එහෙම තියෙනව. අඩි දෙකක් විතර පළල කටුමැටි බිත්ති ඒකෙ තියෙන්නෙ. හැබැයි තාම හොඳට තියෙනව. දැන් අවුරුදු දෙසීයක්වත් වෙනව ඇති ඒකට. මම පනාවැන්න ධර්මාරාමෙට පහේ පංතියට යනකම් ගිහින් ඊට පස්සෙ ඇතුළත්වීමේ විභාගෙන් පාස්වෙලා තමයි ගන්කන්ද මධ්‍ය මහා විද්‍යාලයට ආවෙ. අපේ ගමේ ළමයි ඉතිං ඉස්කෝලෙට කියල සෙරෙප්පු දෙකක්වත් දැම්මෙ නෑ. තරමක් පොහොසත් පවුලක් දෙකක් විතරයි ගමේ හිටියෙ. මොනිටර් මහත්තයලගෙ පවුල තමයි ගමේ පොහොසත් පවුල. මොනිටර් මහත්තයගෙ පුතා තමයි අතුකෝරල මහත්තය. එයා තමයි ඔය තලතා අතුකෝරල මන්ත්‍රීතුමියගෙ තාත්ත. එයාලට ඉඩකඩම් එහෙම තිබුණ. ගමේ පරිසරය ඇතුළෙ අධ්‍යාපනය ගැන ලොකුවට සැලකුවෙ නෑ, ඒ ගැමියො. එදිනෙද වැඩක් පලක් කරගෙන ජීවත්වීම ගැන තමයි හිතුවෙ. ගෑනු ළමයි ඉස්කෝලේ ගියේම නෑ ඒ කාලෙ.

ගොවිතැන් කරණව කියන්නේ ඉතිං තුන්වේලම බත් කන්න පුළුවන්. සම්බෝලයක් එක්ක හරි බත් වරදින්නෙ නෑ. ඒ හැටි සල්ලිය හාගෙ නෑ. ගොවිතැන් වුණත් කෙරුණෙ අත්තම් ක්‍රමේට. ඉස්සර ගම්වල සාමූහිකකමක් තිබුණ හැම වැඩකදිම.

**? පවුලෙ අයියල මල්ලිගෙ කෙරුවාවල් එහෙම කොහොමද...?**

ඒව නම් හරිම විනෝදජනකයි. අයියල වුණත් ඉස්කෝලේ ගියෙ නෑ ඒ හැටි. ලොකු අයිය වැඩි දවසක් ඉස්කෝලේ ගියේම නෑ. ටික දවසකට පස්සෙ තාත්ත ලොකු අයිය ඉස්කෝලෙන් අස්කරගෙන ඇවිත්. තාත්ත හිතන්න ඇත්තෙ කුඹුරු වැඩ කරන්න පවුලෙ කට්ටිය ඕනැ නිසා ලොකු අයිය ඒවට ගන්න. අයියල අක්කල එක්ක ඉතිං නොයෙකුත් මතක තියෙනව ඒ කාලෙ කරපු. ගෙදරක ඉන්නෙම නෑ. ඉස්කෝලේ යන්නෙ නැති දවසට මම ගමේ කොල්ලො එක්ක ගංගොඩේ කරක්ගහන එක තමයි රාජකාරිය. පංසලේ විශේෂ වැඩක් කෙරෙනවනම් දවස් ගණන් එතන. ඔය අතරෙ කලාව පැත්තට හිත යන්න හරි අපූරු දේවලුත් ගමේ සිද්ධවෙනව ඉඳහිට.

**? මොකද්ද ඒ කලාලෝලී වැඩ ගමේ වෙච්ච...?**

කොළඹ ඉඳන් ටීටර් කණ්ඩායම් හිටිගමන් ගමට එනව. බී.ඒ.ඩබ්ලිව්. ජයමාන්නල, සිරිසේන විමලවීරලනෙ ඕකෙ පුරෝගාමියො. එයාලගෙ ටීටර් කට්ටිය අපේ ගමටත් එනව කාලෙන් කාලෙට. එයාල ගමෙන් ගමට ගිහින් ඒව පෙන්නනව. අපේ ගමේ ඔය වැඩේ කරගහල කෙරුවෙ වෙල්විදනෙ මහත්තය, ඕර්සියෙල් මහත්තය, තැපැල් පියුන් මහත්තය වගේ අය. ඕවට ගමේ අයත් සම්බන්ධ කරගන්නව. අපේ ලොකු අයියත් ඔය ටීටර්වල ගෑනු චරිතවලට ඉන්නව. පුංචි අයිය යනව දුෂ්ටයගෙ චරිතයට. ගමේ ඉස්කෝලේ භාග බිත්ති තියෙන හෝල් එක පොල්අතු එහෙම එල්ලල වහල තමයි ඕව පෙන්නන්නෙ. ගුණපාල මාස්ටර් කියල කෙනෙක් හිටිය මට මතකයි ඒ කාලෙ 'ෆුට්බෝලෝ සර්පිනාව' හරි ලස්සනට වාදනය කරනව. සර්පිනාවයි තබ්ලාවයි විතරයි ඕවට ගන්නෙ. වෙන මහ ලොකු සංගීත භාණ්ඩ කියල දෙයක් නෑ. ඒ දවස්වලත් කලාවට ටිකක් ළැදි අය කොණ්ඩෙ එහෙම වවනව. ගම්වලටත් ඔය ආභාසය ගියා. ගමෙත් ටිකක් ඕවට කැමති අය කොණ්ඩකාරයො වෙන්න ගත්ත. ගමේ මිනිස්සුන්ට හරි විනෝදස්වාදයක් ගෙනාපු දෙයක් වුණා මේ ටීටර් නැටිල්ල.

**? ඉස්සර ගමේ පංසලේ පෙරහර වුණත් සෑහෙන සංස්කෘතික ඉවෙන්ට් එකක් නේද...?**

ඇත්තටම ඔව්. පෙරහර කියන්නේ ගමේම අය එකතුපහදු වෙන කලා මංගල්ලයක්. ඒවයි ආගමික සාරය වගේම සංස්කෘතික විචිත්‍රත්වයත් සෑහෙන්න තිබුණ. අපේ ගමේ පෙරහර තනිකරම මහ සමන් දේවාලෙ පෙරහැරේ ආකෘතියටම වගේ තමයි කෙරුනෙ. බහබඹා වගේ චරිත පවා ඒ පෙරහරේ යනව. පහතරටින් එනව පහතරට නැට්ටුවො. සබරගමු නැටුම් කොහොමත් එහෙට ආවේණික අංගනේ. උඩරට නැටුම් කණ්ඩායම් එනව. අලි එහෙමත් ගෙන්නනව. පෙරහැරේ අන්තිම හරියෙ තමයි නාගසලං එහෙම යන්නෙ. අපි කොල්ලො කාණ්ඩෙ රංචු ගැහෙන්නෙ ඒ හරියට තමයි. අපේ පෙරහැරේ කොටි නැටුම කියල එකක් නැටුව 'කොටි සයිමන්' කියල ගමේ ඉඳපු මනුස්සයෙක්. එයා ඔය 'මාර්ෂල් ආර්ට්ස්' එහෙම කරපු කෙනෙක්. හරි ලස්සනයි ඒ ඔක්කොම එකතු වුණාම. පෙරහර වගේම තමයි ගමේ පංසලේ සල්පිලත්. ඒකත් හරි ලස්සන වැඩක් කවුරුත් එකතුවෙලා කරන.

**? කොහොමද ගන්කන්ද මහ විද්‍යාල පරිච්ඡේදය...?**

ගමේ ඉස්කෝලේ පහේ පංතියට ගිහින් එතන ඉඳල තමයි ගන්කන්ද ඉස්කෝලේ යන්න ගත්තෙ. ගමේ ඉස්කෝලේදි වගේම ගන්කන්දෙදිත් මම තමයි ඉස්කෝලේ සිංදුකාරයා. ඒවට තල්ලුව දීපු ගුරුවරුත් හිටිය. මගේ සිංදු කියන හැකියාව ගැන පැහැදිල ඒ අය මට ඒකට අවශ්‍ය අවස්ථා දුන්න. ඉස්කෝලේ සමිති සමාගම්වලදීත් මට සිංදුවක් කියන එක අනිවාර්ය වුණා. දවසක් සමිතියක මම කිව්වා "වනමෝහිනී" චිත්‍රපටියෙ සිංදුවක්. "දෑතට දෑත තියාලා" සිංදුව තමයි කිව්වේ. සමිතිය ඉවරවෙලා සර් කෙනෙක් මට පැත්තකට අඬගහල කිව්ව, සිංදුව නම් හොඳයි හැබැයි ඔය ළමයට ඒක ගැළපෙනව මදි නේද කියල. මට ලජ්ජත් හිතුන. ඊට පස්සෙ ඇහුව ගෙදර රේඩියෝ එකක් තියෙනවද කියල. එතකොට අපේ තාත්ත ගෙදරට රේඩියෝ එකක් ගෙනත් තිබුණෙ. තාත්තට සැරයක් මැණික් ගලක් වැඩ කරල පැට්‍රොමැක්ස් එකකුයි රේඩියෝ එකකුයි ගෙනාවා. අර සර් මට කිව්ව ගෙදර රේඩියෝ එකක් තියෙන එකේ අමරදේව කියල ගායකයෙක් ඉන්නව, එයාගෙ සිංදු අහන්න කියල. ඒ කාලෙ මට අමරදේව පෙන්නන්න බෑ. පස්සෙ නම් මට සෑහෙන සමීපවුණා අමරදේව මහත්තය.

ඉස්කෝලේ ගියා කියල ලොකුවට පාඩම් කෙරිල්ලක් නෑ. රස්තියාදුවම තමයි. ඉස්කෝලේ යනගමන් පාරෙ තියෙන සිගරට් කොට අහුලගෙන බොනව, කොල්ලො කාණ්ඩෙට වැටිල. දඟ වැඩ කරනව කියල රිපෝට් දෙක තුනකුත් වැදිල තිබුණෙ. ගන්කන්ද විද්‍යාලෙ ටික දවසක් යනකොට මට හිතුණ මෙතන හරියන්නෙ නෑ, ආපහු ගමේ ඉස්කෝලේ ගියා නම් හොඳයි කියල. බලෙන්ම වගේ අස්වෙලා ආපහු ගමේ ඉස්කෝලේට ආවා. ඒකෙදි සාමාන්‍ය පෙළ ලියල ඉස්කෝලේ හොඳම ප්‍රතිඵල අරගෙන උසස් පෙළ කරන්න ආපහු සැරයක් ගන්කන්ද ඉස්කෝලෙට ගියා. හැබැයි උසස් පෙළ දෙවතාවක් අසමත් වුණා. විශ්ව විද්‍යාලෙට යන්න බැරිවුණ නිසා තුන්වෙනි පාර හිතට අරන් පාඩම් කරල පාස්වුණා.

**? ඒ එක්කම තමයි ඔබේ ජීවිතේ වෙනස් කරන පේරාදෙණි සමය ඇරඹෙන්නෙ....**

ඔව්. පේරාදෙණි විශ්වවිද්‍යාලය මගේ ජීවිතේ වෙනස් කරපු තැනක්. ඒක මගේ කලා ජීවිතෙත් පෞද්ගලික ජීවිතෙත් සංධිස්ථානයක්. නවසිය හැටහතේ ඔක්තෝබර් හතරවෙනිද තමයි මම පේරාදෙණියෙ ගියෙ මුලින්ම. මුල කාලෙ ඉතිං රැග් එක හම්බවෙනවනෙ. මට රැග් එකත් හරි සුන්දර අත්දැකීමක් වුණා. මට සිංදු කියන්න පුළුවන් කියල දැනගත්ත ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යයො රැග් එක කියල කෙරුවෙ මං ලව්ව සිංදු කියවපු එක. වෙන දරුණු රැග් එකක් මට හම්බවුණෙ නෑ. එහෙම වුණා නම් ඉස්කෝලේ වගේ කැම්පස් එකත් එපා වෙන්න තිබුණ. සීනියර් අයියල මාව ඒගොල්ලන්ගෙ කාමරවලට එහෙමත් එක්ක ගිහින් සිංදු කියවගන්නව සමහර වෙලාවට.

ඔහොම ඉන්න අතරෙ දැන් මගේ ලොකුම ආසාව තමයි එදිරිවීර සරච්චන්ද්‍ර දැකල හම්බවෙලා කතා කරන එක. ඒකට බලපෑම් කරපු දෙන්නෙක් ගන්කන්ද ඉස්ලෝලෙ උසස් පෙළ කරද්දී මට හම්බවෙනව. එක්කෙනෙක් සීතා අරුන්තවනාදන් කියල ටීචර් කෙනෙක්. එයා පේරාදෙණි පාස්අවුට් වෙච්ච කෙනෙක්. එයා තමයි අපේ ක්ලාස් ටීචර්. එයා ඩොක්ටර් සරච්චන්ද්‍රගෙ නාට්‍යයක රඟපාල තියෙනව. එයා මගේ සිංදු කියන්න තියෙන හැකියාව එහෙම ගැන දන්න නිසා උනන්දු කෙරෙව්ව පේරාදෙණි ගිහින් සරච්චන්ද්‍ර මහත්තය හම්බවෙලා හොඳ ගමනක් යන්න කියල. තව කෙනෙක් තමයි බණ්ඩාර සර්. එයත් මට කිව්ව කොහොමහරි විභාගෙ පාස්වෙලා පේරාදෙණියට ගිහින් සරච්චන්ද්‍ර හම්බවුණොත් වරදින එකක් නෑ කියල. බණ්ඩාර සර් පළවෙනි මනමේ කුමාරයට රඟපාපු බෙන් සිරිමාන්නගෙ බැච්මේට්. ඕව මේව එක්ක ඉතිං මගේ ලොකුම හීනෙ වෙලා තිබුණෙ සරච්චන්ද්‍ර හම්බවෙන එක.

නව කොටසක් ලබන සතියට...

■ ප්‍රියන්ත කොඩිප්පිලි


මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර


දිගාගෙ උසස් පෙළ පන්තිභාර ගුරුතුමිය සීතා වින්සර්


දිගාගෙ මව ඇලිස් නෝනා


දිගාගෙ පියා පීරිස් සිඤ්ඤෝ